# එදා සහ අද

නෝර්වේ ඇතුළු බටහිර රටවල්වලට විරුද්ධව යම් ක්‍රියා මාර්ගයක් ගන්නා ලෙසට ඉල්ලීමට ලංකාවේ ඉන්දීය මහා කාමසාරිස්වරයා හමුවීමට ගිය ඇතැම් දේශ හිතෛෂීන් හා ජාති ප්‍රේමීන් අද ඉන්දියාවේ ඇඟිලි ගැසීම්වලට විරුද්ධව ජනමතයක් ගොඩනැගීමට කටයුතු කරනු දක්නට ලැබීම තේරුම් ගැනීම අපහසු කාර්යයක් වී ඇත. ඒ ස්‍රි කාලය තුළ ඉ්දියාවේ ප්‍රතිපත්තියේ එතරම් ම විශාල වෙනස්කමක් සිදු වී ඇත් ද?

ඉන්දියාව සමබන්ධයෙන් අපට ඇත්තේ එතරම් ගෞරවයක් නො වෙයි. බෞද්ධයකු ලෙස මගේ ගරුත්වය ඇත්තේ දඹදිවට මිස භාරතයට හෝ ඉන්දියාවට හෝ නො වෙයි. ඊන්දියාව සමග කටයුතු කිරීමේ දී අපි ප්‍රවේසම් විය යුත්තෙමු. අපේ බොහෝ පැරණි රජවරු භාරතය සමග ගනුදෙනු කෙළේ යම් අවබෝධයකිනි.  එසේ කිරීමට නොහැකි වූ අවස්ථාවල දී අපි අමාරුවේ වැටුනෙමු.

අද ද ජනාධිපති මහින්ද රාජපක්‍ෂ මහතාට ඉන්දියාව සමග කටයුතු කිරීමේ දී පැහැදිලි අවබෝධයකින් කටයුතු කිරීමට සිදු වී ඇත. අද ලංකාව සම්බන්ධයෙන් ගත්කල ඉන්දියාවට අවශ්‍ය කුමක් ද? එදා 1987 දී අවශ්‍ය වූයේ කුමක් ද? අවුරුදු විස්සක්  ඇතුළත ඉන්දියාව සහ ලංකාව අතර සම්බන්ධතාවන්හි විශාල වෙනසක් සිදු වී ඇත. 1987 දී ඉන්දියාව මෙරට ප්‍රශ්නයට අත දැම්මේ වඩමාරච්චි සටනත් සමග ය. එදා ඉන්දියාවට අවශ්‍ය වූයේ කොටි සංවිධානය පරාජයෙන් ගලවා ගැනීම ය.

කොටි සංවිධානය ට අවශ්‍ය ආධාර දී ඒ හදා වඩා ගත්තේ ඉනිද්යාව ය. එදා පැවති ජේ. ආර් . ජයවර්ධන ආණ්ඩුවට විරුද්ධව කොටි පෝෂණය කිරීම ඉන්දිරා ගාන්ධි මහත්මියගේ අභිප්‍රාය විය. ජයවර්ධන ආණ්ඩුවේ බටහිර ගැති විදේශ ප්‍රතිපත්තිය යළුට ප්‍රධාන හේතුව විය. ගාන්ධි මහත්මියගේ ක්‍රියා කලාපය නිවැරදි යැයි මෙයින් නො කියැවෙයි. ජයවර්ධන ආණ්ඩුවට ද ඉන්දිය ආණ්ඩුවට මෙන් ම තමන් කැමති විදේශ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමේ නිදහස තිබුණි. ඒ හරි ද වැරදි ද යන්න තීරණය කළ යුතුව තිබුණේ මෙරට ජනතාව මිස ඉන්දියාව නො වෙයි.

අනෙක් අතට ලංකාව සම්බන්ධයෙන් ඉන්දියාවට වෙනත් ප්‍රතිපත්ති ද විය. ලංකාවේ දෙමළ ජනයාට ඇතැයි කී දුක්ගැනවිලිවලට ඉන්දියාව යෝජනා කෙළේ අපට කිසිසේත් පිළිගැනීමට නොහැකි ප්‍රතිපත්තියකි. උතුරු හා නැගෙනහිර පළාත් දෙමළ ජනයාගේ නිජභූමිය හෙවත් සාම්ප්‍රදායික වාසභූමි යැයි පිළිගත් ඉන්දියාව ඒ පළාත් තාවකාලික ව හෝ එක් කිරීමට යෝජනා කෙළේ ය. පළාත් සභා විසඳුමෙහි මර්මස්ථානය වූයේ මේ නිජභූමි සංකල්පය හා ඒ පළාත් දෙක එක් කිරීම ය.

ලංකාවේ වෙන ම රාජ්‍යයක් සඳහා සටන් කරමින් සිටි කොටි සංවිධානය පමණක් නොව වෙනත් දෙමළ පක්‍ෂ ද ඒ පළාත් එක්කිරීම වෙනුවෙන් පෙනී සිටියේ ය. එපමණක් නොව මුස්ලිම් සංවිධාන ද ඒ ප්‍රතිපත්තියෙහි පිහිටියේ ය. වෙන ම රාජ්‍යයක් සඳහා කොටින්ට  උතුරු හා නැගෙනහිර පළාත් දෙමළ ජනයාගේ හෝ අඩුම තරමින් මුස්ලිම් ජනයා රැවටීම සඳහා ඊනියා දෙමළ කතාකරන ජනයාගේ නිජභූමි ලෙස සැලකීම අවශ්‍ය විය. ඉන්දු ලංකා ගිවිසුමින් ඒ බව පිළිගැනුණි.

පසුගිය අවුරුදු විස්ස  තුළ මේ තත්වය වෙනස් කරනු ලැබ ඇත. එක් අතෙකින් එසේ වෙනස්කරනු ලැබීමට කොටි සංවිධානය ද දායක වී ඇත. ඊනියා ඉන්දිය සාම සාඨක හමුදා ලංකාවට පැමිණියේ කොටි සංවිධානය පරාජය කිරීමට නො වේ. ජේ ආර් ජයවර්ධන මහතා එසේ කත නමුදු ඒ පිළිගැනීමට නොහැකි ය. ඊනියා සාම සාඨක හමුදාව ලංකාවට පැමින ටික කලක් ගතවන තුරු කොටින්ට එරෙහි ව කළ සටනක් නො වී ය. ඔවුන් කොටි සංවිධානයට එරෙහිව සටන් කෙළේ කොටි ඔවුන්ට විරුද්ධව සටන් වැදීමෙන් පසුව ය.

ඉන්පසු කොටි රජිව් ගාන්ධි මහතා ඝාතනය කළහ. තමිල්නාඩුවේ කිහිප දෙනකු හැරෙන්නට ඉන්දියාව පුරා කොටින්ට විරුද්ධව මහජන මතයක් ගොඩ නැගිණි, අද එදා මෙන් නොව ඉන්දියාවට කොටි පරාජය කිරීමෙද අවශ්‍යතාව වෙයි,

© Prof. Nalin De Silva

අද ද බ්‍රිතානිය නෝර්වේද ඇතුළු බටහිර රටවල් ගණනාවකට කොටි ආරක්ෂා කිරීමේද අවශ්‍යතාව වෙයි. ඊනියා දේශපාලන විසඳුමක් ගැන බ්‍රිතානිය හා ඉන්දියාව එකට ප්‍රකාශ නිකුත් කළ ද ඔවුන්ගෙග් අවශ්‍යතා වෙනස් බව අපි දනිමු.

මෙයින් කියැවෙන්නේ ඉන්දියාව අද ලංකාව සම්බන්ධයෙන් යහපත් ප්‍රතිපත්තියක් අනුගමනය කරන බව නො වේ. එහෙත් අද ඉන්දියාවට අපට එරෙහිව විනාශකාරී ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමට ඇති ඉඩකඩ අඩු ය. මහින්ද රාජපක්ෂ මහතාගේ විදේශ ප්‍රතිපත්තියට විරුද්ධවීමට තරම් සාධක ඉන්දියාවට නැත. එහෙත් ඒ සියල්ලට ම වඩා පසුගිය අවුරුදු විස්ස තුළ ලංකාවේ විශ්ල වෙනසක් සිදු වී ඇත.

ංද උතුරු හා නැගෙනහිර පළාත් දෙමල ජනයාගේ නිජභූමි ලෙස නො පිළිගැනෙයි. අද පළාත් සභා ඉදිරිපත් කෙරෙන්නේ දෙමළ ජනයාට සිදු වී ඇතැයි කියන අසාධාරණවලට විසඳුමක් ලෙස නො වෙයි. මතුපිටින් ගත්කල දෙමළ ජනයාගේ ඊනියා අපේක්ෂාවන් ගැන කතාකරන බව සැබෑ ය. එහෙත් එය එසේ නොවන්නේ ජනවාර්ගික පදනමකින් විසඳුමක් ඉදිරිපත් නොවීම නිසා ය.

අද විසඳුම් ඉදිරිපත් වන්නේ පළාත් පදනමකින් මිස ජනවාර්ගික පදනමකින් නො වේ. දෙමළ ජනයාගෙන් සියයට පණහකට වැඩි පිරිසක් ජීවත්වන්නේ උතුරු හා නැගෙනහිර පළාත්වලින් පිටත ය. පළාත්සභාවලින් එලෙස ඒ පළාත්වලින් බැහැරව ජීවත්වන දෙමළ ජනයාට විශේෂයක් නො කෙරේ. ඒ අතර උතුරු හා නැගෙනහිර පළාත් වෙන්කෙරී ඇත. අද ඒ පළාත්වලට වෙනම පළාත් සභා පිහිටුවීමට කොටි සංවිධානය හැරෙන්නට අනෙක් දෙමළ පක්ෂ ද, මුස්ලිම් පක්ෂ ද එකඟ වී ඇත.

එමෙන් ම අද ඒකීය රාජ්‍යය යන සංකල්පයට ඒ පක්ෂ එකඟ වී ඇත. සන්ධීය, සහසන්ධිය, අසමමිතික බලය බෙදීම ආදී සංකල්ප පරාජය කර ඒකීය රාජ්‍යය සංකල්පයට පැමිණීම ම අප ලත් විශාල ජයග්‍රහණයකි. අද බලපවත්වන්නේ 1987 දී ඉන්දියාවට අවශ්‍ය වූ ප්‍රතිපත්ති නො වෙයි, සර්ව පාක්ෂික නියෝජිත කමිටුව කර ඇත්තේ රටේ අද පවත්නා දේශපාලන බල තුලනය සූත්‍රගත කිරීමක් පමණකි.

එහෙත් මෙහි දී ද දුරදක්නා දේශපාලන නායකත්වයක වැදගත්කම ඉස්මතු වෙයි. ඉන්දියාවට සුළුවෙන් හෝ මැදිහත්වීමකට ඉඩ නොදීම ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ වගකීම වෙයි. අප ඉන්දියාවට මෙන් ම අනෙක් රටවලට ද කිවයුත්තේ කොටි පැරදවීමට අවශ්‍ය ආයුධ ආදිය සපයා අපට ආධාර දෙන්න, එහෙත් කොටින්ට විරුද්ධව හමුදා මෙහෙයවීම ලංකාණ්ඩුවේ සන්නද්ධ සේවාවන්ට පමණක් භාරදෙන්න යන්න ය.

සර්වපාක්ෂික නියෝජිත කමිටු වාර්තාවෙන් කියා ඇත්තේ ජනාධිපතිතුමා දහතුන්වැනි ව්‍යවස්ථා සංශෝධනයේ අදාළ යෝජනා ක්‍රියාත්මක කළ යුතු බව ය. අදාළ යෝජනා කවරේදැයි එතුමා තීරණය කරනු ඇත. පළාත් පොලිස් කොමිසම් පත්කිරීමට මහජන එක්සත් පෙරමුණ හා ජාතික හෙළ උරුමය තදින් විරුද්ධ විය. අවසානයේ දී ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ඒ පිළිබඳ සාකච්ඡාවක් පක්ෂ නායකයන් ගේ ද සහභාගීත්වයෙන් පැැවැත්විණි.

ඒ සාකච්ඡාවේ දී ජාතික පොලිස් කොමිසම සම්බන්ධයෙන් ජනාධිපතිතුමාට ද නැති බලතල පළාත් පොලිස් කොමිසම් සම්බන්ධයෙන් මහඇමතිවරුන්ට ඇති බව පෙන්වා දෙනු ලැබිණි. පසුව සම්මත වූ සංශෝධනවලින් තත්වය තවත් සංකීර්ණ වී ඇත. පළාත් පොලිස් කොමිසම් පිහිටුවීමට ව්‍යවස්ථා සංශෝධනයකින් මෙපිට නොහැකි බව ජනාධිපතිතුමා දනියි.

ඇතැම් අද බාලයන් කියන්නේ අප මේ සියල්ල කර ඇත්තේ කිසිවක් නො දැන බව ය. අප දන්නා දේ ඊයේ පෙරේදා වරිත බවට පත්වූ මේ අඳ බාලයන් දන්නේ නම් රටට වැඩදායක ය. කරුණු නිසි ලෙස අධ්‍යයනය නොකර ලිවීමෙන් ජනතාව මුළාකළ හැකි යැයි සිතීම තරම් මුළාවක් නැත.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva